**ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 30 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 58,451.25 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 56,283.01 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,168.24 ක් හෙවත් සියයට 3.71 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 41,104.05 | 40,746.61 | 357.44 | 00.87 |
| මූලධන | 17,347.20 | 15,536.40 | 1,810.80 | 10.44 |
| **එකතුව** | **58,451.25** | **56,283.01** | **2,168.24** | **03.71** |

2.2 **අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 12601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 1,225.00 | 1,187.05 | 970.00 | 973.79 | 2,310.00 | 1,780.65 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වන 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 969.46 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0006/0064/000 | 0.16 |
| 6000/0000/00/0015/0039/000 | 956.58 |
| 6000/0000/00/0015/0177/000 | 0.19 |
| 6000/0000/00/0015/0199/000 | 5.51 |
| 6000/0000/00/0015/0208/000 | 7.02 |
| එකතුව | 969.46 |

**2.4 විගණන නිරීක්ෂණය**

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන දෙකක් පවත්වා නොතිබුණු අතර, එක් ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 18 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වේයන්ගොඩ සියනෑ විද්‍යාපීඨයේ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |

### 3.2 විගණන සාක්ෂි නොවීම

වේයන්ගොඩ සියනෑ විද්‍යාපීඨය පිහිටි අක්කර 85 කින් සමන්විත ඉඩමේ අයිතිය තහවුරු කිරීම සඳහා වූ ලිඛිත සාක්ෂි නොතිබුණි.

### 3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට 2016 අගෝස්තු 10 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.121,577,330 ක් වී තිබුණි.

### 3.4 විසර්ජන ගිණුම

#### 3.4.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 80.87 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලැසීම හෝ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම ලබා නොදීම නිසා හෝ එම වැය විෂයයන් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයන් සියයට 48 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් ඉතිරිවීම් සිදු කර තිබුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු. මිලියන 211.77 ක් වූ තැන්පතු 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 12601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. මිලියන 1,780.65 ක් වූ අතර, එම හිඟහිටි ශේෂවල වර්ෂ පහකට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු. මිලියන 102.66 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව ගිණුම්කරණ දෝෂ නිසා උද්ගත වූ එකතුව රු. මිලියන 1.15 ක හර ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිවැරදි කිරීමට අපොහොසත්වී තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර හඳුනා නොගත් රු. 890,652 ක වෙනසක් පැවතුණි.

(ඈ) වසර දහයකට පෙර ඇප සහතික තබා නොගෙන නිලධාරියකුට ලබාදුන් දේපල ණය මුදලකින් රු.128,150 ක ශේෂයක් එම නිලධාරියා ස්ථාන මාරුවී ගිය මහා මාර්ග අමාත්‍යාංශයෙන් වාරික වශයෙන් අය කරගෙන තිබුණි. නමුත් අදාළ කාල වකවානුවල ගිණුම් සාරාංශ මගින් එම ණය ශේෂය අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඉ) විශ්‍රාම හා මිය ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 5 ක් ඉක්ම වූ රු. මිලියන 2.39 ක ණය ශේෂ ඔවුන්ගේ විශ්‍රාම පාරිතෝෂිකවලින් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.7.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේදී විදේශ ණය හා ආධාර ව්‍යාපෘති 03 ක් සඳහා රු.මිලියන 5,795.76 ක් වැය කර තිබුණත්, එම වියදම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3.7.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 අගෝස්තු 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.8 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි ඇතැම් වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම<br>රු. | නිෂ්ක්‍රීයව හෝ ඌනඋපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| ගොඩනැගිලි | සියනෑ විද්‍යා පීඨයේ නිල නිවාස 16 ක් | - | වර්ෂයකට වැඩි |
| මෝටර් වාහන | මෝටර් රථ 05 ක්, යතුරු පැදි 02 ක් | - | වර්ෂ 4 කට වැඩි |
| පාසල් උපකරණ | පාසල් 1000 ව්‍යාපෘතිය යටතේ පාසල් සඳහා බෙදාහැරීම නියමිතව පැවැති පරිගණක මේස හා පුටු, ඇඳන්, වානේ අල්මාරි, විද්‍යාගාර පුටු හා වෙනත් උපකරණ ගබඩාවේ රඳවා ගෙන පැවැතීම | - | වර්ෂයකට වැඩි |
| | රසායන ද්‍රව්‍ය | - | වර්ෂයකට වැඩි |
| | භාණ්ඩ 14 ක අයිතම 01 ක සිට 2091 ක් දක්වා පරාසයක ප්‍රමාණයන් | - | වර්ෂ 02 ක සිට වර්ෂ 05 ක් දක්වා |
| පෙළපොත් | කොළඹ 07 බාලිකා විද්‍යාලයක 1 ශ්‍රේණිය සිට 12 ශ්‍රේණිය දක්වා විවිධ විෂයයන්ට අදාළ පෙළපොත් 4,393 | - | වර්ෂයකට වැඩි |

| | | | |
|---|---|---|---|
| වෙනත් වත්කම් | නිල ඇඳුම් රෙදි පැකට් 2,770,402 | 693,762,709 | මාස 07 කට වැඩි |
| මුදල් | හොරණ ජාතික පාසලක විෂය බාහිර හා සමගාමී ක්‍රියාකාරකම් 16 ක් වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදන | 1,381,000 | වර්ෂයකට වැඩි |
| | පාසල් 43 ක පාසල් සංවර්ධන සමිති විසින් බැංකුවල ස්ථාවර තැන්පතුවල ආයෝජනය කළ මුදල් | 633,803,600 | වර්ෂයකට වැඩි |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2016 අගෝස්තු 10 දින වන විටත් ජාතික පාසල් 78 ක, ගුරු මධ්‍යස්ථාන 18 ක, පරිගණක මධ්‍යස්ථාන 25 ක, ඔරුගොඩවත්ත ගබඩාව හා පත්තලගෙදර ගබඩාවට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් 2014 වර්ෂය වෙනුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා තිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් විසින් භුක්ති විඳිමින් පවතින වත්කම්**

අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල්, ගුරු විද්‍යාල හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සතුව පවතින පර්චස් 04 ක සිට පර්චස් 224 ක් දක්වා පරාසයක භූමි ප්‍රමාණයන් සහිත වූ නාගරිකව පිහිටා ඇති ඉඩම් 80 ක් අනුමැතියකින් හා අවසරයකින් තොරව බාහිර පාර්ශවයන් විසින් භුක්ති විඳිමින් පැවතුණි. ඉහළ තක්සේරු වටිනාකම්වලින් යුක්ත වන මෙම ඇතැම් ඉඩම්වල විශාලත්වය හා වර්තමාන වටිනාකම්වල තොරතුරු අමාත්‍යාංශයේ නොතිබුණි.

**(ඈ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

ආරක්ෂක සේවා විද්‍යාලයට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා 2008 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත සලසා තිබුණු රු. මිලියන 1,191.97 ක ප්‍රතිපාදන උපයෝගීකර ගනිමින් රු. මිලියන 1,098.24 ක් වැය කර නාගරික සංවර්ධන අධිකාරිය සතු හෙක්ටයාර් 1.9329 ක් වූ භූමියෙහි ගොඩනැගිලි ඉදිකර තිබුණු නමුත් විද්‍යාලයීය භූමියේ නෛතික අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ) බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් 31 දින වන විට බේරුම් නොකළ බැරකම් රු. මිලියන 3,437.50 ක් විය.

**3.9 අනුකූල නොවීම්**

**------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**----------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) XLVIII පරිච්ඡේදයේ 31.1 වගන්තිය | නුගේගොඩ බාලිකා විද්‍යාලයක විදුහල්පතිනිය සම්බන්ධයෙන් කරන ලද මූලික විමර්ශන අනුව අභ්‍යන්තර විගණකගේ 2011 ජනවාරි 07 දිනැති අංක ED/S/84/6/2/1 දරන වාර්තාවෙන් චෝදනා පත්‍රයක් නිකුත් කිරීමටත්, ඒ අනුව වැඩ තහනම් කිරීමටත් නිර්දේශ කර තිබුණි. එම නිර්දේශ පිළිබඳ නොසලකා වහාම ක්‍රියාත්මක වන පරිදි 2011 පෙබරවාරි 07 දින සිට අනිවාර්ය නිවාඩු යැවීමට කටයුතු කර තිබුණි. එදින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා කිසිදු සක්‍රීය සේවයකින් තොරව ඇය වෙත ගෙවා තිබූ මුළු වැටුප් හා දීමනාවල එකතුව රු.3,737,426 ක් වූ අතර, 2016 ජුනි 27 දිනැති අංක PSC/DP/4/2011/SLEAS/1 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ ලිපිය අනුව කරුණු හතරකට යටත්ව නැවත සේවයේ පිහිටවීමට නියෝග කර තිබුණි. |
| (ii) ll වන පරිච්ඡේදයේ 13.3 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසාන වන විට දිවයින පුරා පිහිටි ජාතික පාසල් 350 කින් ජාතික පාසල් 49 ක 2009 වසරේ සිටද, 106 ක 2016 ජුනි මාසය දක්වාද, විදුහල්පති පුරප්පාඩු සඳහා වැඩ බැලීමේ නිලධාරීන් පත්කර තිබුණි. |
| (iii) II වැනි කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 1.2, 13.2 හා 17.12 වගන්ති | (i) නිලධාරීන් 21 දෙනෙකුට අදාළ අවිනය සම්බන්ධ චෝදනා වසර 03 ක සිට වසර 10 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විට එම නිලධාරීන් සඳහා වන විනය ක්‍රියාමාර්ග අවසන් කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. |

(ii)ළමා අපචාර චෝදනාවලට ලක්වූ නිලධාරීන් සම්බන්ධව විනය පරීක්ෂණ ඉතා කඩිනමින් පවත්වා දඬුවම් ලබාදිය යුතු වුවත්, එසේ අප්‍රමාදව කටයුතු නොකිරීමෙන්ද, ඔවුන් වෙනත් පාසල් වෙත මුදා හැරීමෙන් හෝ එම පාසල් තුළම රඳවා තබා ගැනීමෙන්ද අදාළ පාසල් සිසු දරු දැරියන්ගේ අධ්‍යාපන කටයුතුවලට මෙන්ම පාසලේ විනය පවත්වාගෙන යාමටද අහිතකර ලෙස බලපා තිබුණි.

| | | |
|---|---|---|
| (iv) | XII වැනි පරිච්ඡේදයේ 1.1 වගන්තිය | 2015 වර්ෂයේදී ජාතික පාසල් 27 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 128 දෙනෙකු විසින් අනුමැතියකින් තොරව දින 3396 ක නිවාඩු ලබාගෙන තිබුණි. |
| (v) | VII වැනි පරිච්ඡේදයේ 2 වගන්තිය | 2015 වර්ෂයේදී ජාතික පාසල් 86 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 448 දෙනෙකු දින 8030 ක් වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබුණු නමුත්, එම නිවාඩු සඳහා ගෙවා තිබුණු වැටුප් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | III වැනි පරිච්ඡේදය | අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් 46 දෙනෙකු වර්ෂ 05 ක සිට 22 ක් දක්වා කාල පරිච්ඡේදයක සිටද, සංවර්ධන සහකාර තනතුරු 84 කින් 76 දෙනෙකු වර්ෂ 10 කට වැඩි කාලයක සිටද, 8 දෙනෙකු වර්ෂ 6 ක සිට 9 ක් දක්වා කාලයක්ද, අනෙකුත් අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවාවලට අයත් නිලධාරින් 42 දෙනෙකු වසර 07 ක සිට 25 ක් දක්වා කාලයක්ද ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ස්ථාන මාරුවීම් කර නොතිබුණි. ඇතැම් නිලධාරීන් දැනට අනුයුක්ත ශාඛාවලද, ඇතැම් නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශයට පැමිණි දින සිටම එකම ශාඛාවකද සේවයේ යෙදී සිටින බව නිරීක්ෂණය විය. |

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

**---------------------------------------**

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 371 (2) | දෙහිවල බාලිකා විද්‍යාලයක 2015 වර්ෂයේදී අවස්ථා 43 කදී ලබාදී තිබුණු එකතුව රු.441,980 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණු අතර, ඇතැම් කටයුතුවලදී ලබාගත් අත්තිකාරම් පියවීමට පෙර නැවත අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 384 | හොරණ ජාතික පාසලක ලංකා බැංකු ශාඛාවේ පවත්වාගෙන යන පාසල් සංවර්ධන සමිති ජංගම ගිණුමෙන් අවස්ථා 16 කදී එකතුව රු.138,785 ක මුදල් චෙක්පත් 16 ලියා තිබුණි. ඉන් එකතුව රු.96,285 ක් වූ චෙක්පත් 10 ක් එකම ගුරුභවතෙකු වෙත නිකුත් කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 1645 | කොළඹ 07 බාලිකා විද්‍යාලයක වාහන 03 ක් හා දෙහිවල බාලිකා විද්‍යාලයක වාහන 02 ක් සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා පවත්වා නොතිබුණි |
| (iv) | මුදල් රෙගුලාසි 1645 (අ) | පොදු 267 ආකෘතිය ප්‍රකාරව අමාත්‍යාංශයේ වාහනවල ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |

**(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ** .

**---------------------------------**

| | | |
|---|---|---|
| (i) | 2014 ජුනි 18 දිනැති අංක 19/2014 දරන චක්‍රලේඛයේ 2.2 ඡේදය හා 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 217 වගන්තිය | 2015 මාර්තු මාසයේදී ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් 48 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ ස්ථාන මාරුවීම් අනුව කටයුතු කර නොතිබුණි. එසේ කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් අදාළ ගැසට් නිවේදනය පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) | 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛය | නියැදි විගණන පරීක්ෂණවලදී රජයේ පාසලක වසර 08 කට වඩා වැඩි සේවා කාලයක් සේවය කර ඇති ගුරුවරුන් ස්ථාන මාරු වීම් ලබා දී නොතිබුණු අවස්ථා අනාවරණය විය. විස්තර පහත දැක්වේ. |

| | | |
|---|---|---|
| | | (i) ජාතික පාසල් 109 ක ගුරුභවතුන් 4089 දෙනෙකු වර්ෂ 08 ක සිට වර්ෂ 27 ක් දක්වා කාල පරාසයක සිට ස්ථාන මාරුවීම් නොලබා එකම පාසලක සේවයේ යෙදී තිබුණි.<br>(ii) ජාතික පාසල් 83 ක ගුරුභවතුන් 495 දෙනෙකු ඔවුන් පත්වීම් ලද විෂයයට පරිබාහිර විෂයයන් ඉගැන්වීම සඳහා අනුයුක්ත කර තිබුණි. විශේෂයෙන් ජාතික පාසල් 32 ක ප්‍රාථමික ගුරු පුහුණුව නොලද ගුරුභවතුන් 132 දෙනෙකු ප්‍රාථමික ශ්‍රේණිවලට අනුයුක්ත කර තිබුණි. |
| (iii) | 2013 මැයි 23 දිනැති අංක 23/2013 චක්‍රලේඛයේ 6.1 (I) ඡේදය, 6.1 (IV) ඡේදය හා 6.3 (11) ඡේදය | (i) කොළඹ මරදානේ පිරිමි ජාතික විද්‍යාලයක 2016 වර්ෂය සඳහා පලමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන අයුරින් ඡන්ද හිමිකම නොතිබූ වර්ෂවලට අදාළව අවස්ථා 29 කදීද, ආසන්නතාවය මත අවස්ථා 3 කදීද, සහෝදර පදනම මත අවස්ථා 10 කදීද හා අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනවල කාර්ය මණ්ඩල පදනම මත අවස්ථා 9 කදීද වශයෙන් දරුවන් 51 දෙනෙකු වෙත වැඩිපුර ලකුණු ලබා දී තිබුණි.<br>(ii) අදාල රාජකාරිය අවසන් වූ වහාම එම රාජකාරිය සිදුකළ බව තහවුරු කිරීම පිණිස තම අත්සන තැබිය යුතු වුවත්, සිසුන් සඳහා වූ සම්මුඛ පරීක්ෂණවලදී ලකුණු පත්‍රිකාවල සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වූ නිලධාරින් අත්සන් යොදා එම ලකුණු සහතික කර නොතිබුණි. |
| (iv) | 2013 මැයි 23 දිනැති අංක 23/2013 චක්‍රලේඛයේ 18 ඡේදය | එක් ශිෂ්‍යයෙකුගෙන් රු.1,000,000 ක මුදලක් රැගෙන ඉන් රු.600,000 ක් සඳහා පාසල් සංවර්ධන සමිති ලදුපතක් නිකුත් කර එක් විද්‍යාලයකට ළමුන් බඳවා ගෙන ගෙන තිබුණි. |
| (v) | 2013 මැයි 23 දිනැති අංක 23/2013 දරන චක්‍රලේඛයේ 11.3 ඡේදය | එකම දරුවාගේ නම පාසල් කිහිපයක තිබීම වැලැක්වීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් තබා ඉහළ ප්‍රමුඛතා ලබා ඇති පාසල් ලේඛනයෙන් හැර අනෙක් ලේඛනවලින් එම දරුවන්ගේ නම් ඉවත් කර, පොරොත්තු |

| | | |
|---|---|---|
| | | ලේඛනයේ දරුවන්ට එම අවස්ථාවන් ලබාදිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (vi) | 2013 නොවැම්බර් 28 දිනැති අංක 07/2013 චක්‍රලේඛයේ 10.2 ජේදය | නියැදි විගණන පරීක්ෂණ අනුව හොරණ ජාතික පාසලක රු. මිලියන 1 ක සිට රු.මිලියන 5 ක් දක්වාද, දෙහිවල බාලිකා විද්‍යාලයක රු.මිලියන 1.1 ක සිට රු.මිලියන 2.5 දක්වාද, කොළඹ 07 බාලිකා විද්‍යාලයක රු.මිලියන 0.3 ක සිට රු.මිලියන 9.5 ක් දක්වාද පරාසයක මුදල් 2015 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කෙටිකාලීන අයෝජනවල තැන්පත් කර ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු නොකර පාසල් සංවර්ධන ජංගම ගිණුමේ එම මුදල් රඳවා තිබුණි. |
| (vii) | 2013 නොවැම්බර් 28 දිනැති අංක 07/2013 චක්‍රලේඛයේ 11 හා 12 ජේද | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව රු.500,000 ට වැඩි ප්‍රසම්පාදනයන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් සිදු කළ යුතු වුවත්, ඊට අනුකූල නොවන අයුරින් හොරණ ජාතික පාසලක පාසල් මට්ටමින් මිල කැඳවීම් සිදුකර තෝරාගත් සැපයුම්කරුගෙන් රු.208,815ක්ද, වෙනත් සැපයුම්කරුවකුගෙන් රු.336,250 ක්ද වශයෙන් එකතුව රු.545,065 ක ප්‍රසම්පාදනය කර තිබුණි. |
| (viii) | 2013 නොවැම්බර් 28 දිනැති අංක 07/2013 දරන චක්‍රලේඛයේ හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 11.3 මාර්ගෝපදේශය | (i) චක්‍රලේඛයේ හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව පාසල් සංවර්ධන සමිතිය විසින් පවරාගන්නා ලද ඉදිකිරීම් කාර්යයන් උප කොන්ත්‍රාත් ලබාදිය නොහැකි වුවත්, ජාතික පාසලක විදුහල්පතිවරයකු විසින් සමස්ථ ඉදිකිරීම් කටයුතු රු.428,650 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. ගෙවීම් කිරීමේදී විදුහල්පතිවරයා විසින් සකස් කරන ලද හිස් ඉන්වොයිස් පතක් මත රු. 265,150 ක් ගෙවා තිබුණි.<br>(ii) ව්‍යාපෘති 03 ක් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ජාතික පාසල් සංවර්ධන අරමුදලට ලබාදී තිබුණු රු.600,000 ක ප්‍රතිපාදනවලින් |

| | | |
|---|---|---|
| | | රු.212,750 ක ඉදිකිරීම් කාර්යයක් උපකොන්ත්‍රාත් ලබාදී තිබුණු අතර, වැඩ අවසන් නොකළ හා ප්‍රාදේශිය ඉංජිනේරු තැන නිර්දේශ නොකළ වර්ග අඩි 419 ක් සඳහා රු.31,771 ක් ගෙවා තිබුණි. |
| | | (iii) හොරණ ජාතික පාසලක කාර්යයක් සඳහා මුදල් රෙගුලාසිවලින් සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව කොන්ත්‍රාත්තුව කොටස් කර, ගෙවීම් සඳහා ගුරුවරුන් හතර දෙනෙකුගේ නම්වලට චෙක්පත් ලියා ඔවුන්ගේ පුද්ගලික ගිණුම් මගින් මුදල් කර ගෙන තිබුණි. මිල සැඳහුම් ක්‍රමය අනුගමනය නොකරමින් හා ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා නොගත් සැපයුම්කරුවකුගෙන් තීන්ත මිලදී ගැනීම සඳහා රු.31,788 ක් වැය කර තිබුණි. |
| (ix) | 2013 නොවැම්බර් 07 දිනැති අංක 38/2003 දරන චක්‍රලේඛය | (i) 2015 දෙසැම්බර් 31 දිනට ජාතික පාසල් 110 ක පවතින ගුරු ඌනතා 1524 ක් හා අතිරික්තතා 770 ක් අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) ජාතික පාසලක නියෝජ්‍ය විදුහල්පතිවරුන් වෙත සතියකට කාල පරිච්ඡේද 10 ක් ඉගැන්වීම් කටයුතු පැවරිය යුතු නමුත් ජාතික පාසල් 35 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 73 දෙනෙකු වෙත එකම කාල පරිච්ඡේදයක් හෝ ඉගැන්වීම් කටයුතු පවරා නොතිබුණි. ජාතික පාසල් 9 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 10 දෙනෙකු වෙත ලබාදී තිබුණු කාලපරිච්ඡේද සංඛ්‍යාව 02 ක සිට 06 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. |
| | | (iii) සහකාර විදුහල්පතිවරුන් වෙත සතියකට විනාඩි 40 ක කාල පරිච්ඡේද 12 ක් ඉගැන්වීමේ කටයුතු පැවරිය යුතු වුවත්, ජාතික පාසල් 12 ක සහකාර විදුහල්පතිවරුන් 19 දෙනෙකු වෙත එකම කාල පරිච්ඡේදයක් හෝ ඉගැන්වීම් කටයුතු පවරා නොතිබුණි. ජාතික පාසල් 12 ක සහකාර විදුහල්පතිවරුන් 18 දෙනෙකු වෙත ලබාදී තිබුණු කාලපරිච්ඡේද සංඛ්‍යාව 02 ක සිට |

| | | | |
|---|---|---|---|
| | | | 06 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. |
| | | (iv) | විෂයය ඉගැන්වීමේ නියුතු ගුරුභවතුන් පිළිවෙලින් සතියකට අවම වශයෙන් විනාඩි 40 කාලපරිච්ඡේද 35 ක් ඉගැන්වීමේ කාර්යයෙහි නියුක්ත විය යුතු වුවද, ජාතික පාසල් 77 ක ගුරුභවතුන් 442 දෙනෙකු වෙත එකම ඉගැන්වීම් කාලපරිච්ඡේදයක් හෝ ලබාදී නොතිබුණි. ජාතික පාසල් 79 ක ගුරුභවතුන් 906 දෙනෙකු වෙත ඉගැන්වීම් කාලපරිච්ඡේද 16 කට වඩා අඩු සංඛ්‍යාවක් ලබාදී තිබුණි. මීට අමතරව හොරණ තක්ෂිලා විද්‍යාලයේ ගුරුභවතුන් 171 දෙනෙකුගෙන් 16 දෙනෙකු වෙත පමණක් කාලපරිච්ඡේද පවරා තිබුණි. |
| (x) | 2015 මාර්තු 26 දිනැති අංක 12/2015 දරණ චක්‍රලේඛය | (i) | ජාතික පාසලක් සඳහා නියමිත නියෝජ්‍ය විදුහල්පතිවරුන් සංඛ්‍යාව ඉක්මවා ජාතික පාසල් 55ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 99 දෙනෙකුද, සහකාර විදුහල්පතිවරුන් සංඛ්‍යාව ඉක්මවා ජාතික පාසල් 28ක සහකාර විදුහල්පතිවරුන් 61 දෙනෙකුද පත්කර තිබුණි. |
| | | (ii) | ජාතික පාසලක අධීක්ෂණ කාර්යයේ නියුතු ගුරුභවතුන් වෙත සතියකට අවම වශයෙන් විනාඩි 40 ක ඉගැන්වීම් කාල පරිච්ඡේද 16 ක් පැවරිය යුතු වුවත්, ජාතික පාසල් 14 ක ගුරුභවතුන් 59 දෙනෙකු වෙත එකදු කාල පරිච්ඡේදයක් හෝ ලබාදී නොතිබුණු අතර, ජාතික පාසල් 12 ක ගුරු භවතුන් 66 දෙනෙකු වෙත ඉගැන්වීම් කාල පරිච්ඡේද 16 කට වඩා අඩු සංඛ්‍යාවක් ලබාදී තිබුණි. |
| (xi) | 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 37/2008 හා 2015 ජුනි 30 දිනැති අංක 23/2013(ii) දරන චක්‍රලේඛය | | සීමාවන් ඉක්මවා ජාතික පාසල් 66 ක් විසින් ඇතුළත් කරගෙන තිබුණු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 6,105 ක් විය. ඒ අතර, ජනප්‍රිය පාසල් ලෙස සැලකෙන ජාතික පාසල් 32 ක් විසින් අදාළ සීමාව ඉක්මවා ඇතුළත් කර තිබුණු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 5,373 ක් වී තිබුණි. |

(xii) 2012 නොවැම්බර් 23 දිනැති අංක 42/2012 චක්‍රලේඛය — දිවයිනේ පළාත් 9 හි විශේෂ අධ්‍යාපන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 411 ක් වූ අතර, විශේෂ අධ්‍යාපන ගුරු පුහුණුව ලැබූ ගුරුවරුන් 355 ක් වෙනත් පාසල් හෝ පන්ති කාමරවල සේවයේ යොදවා තිබුණි.

## 3.10 විදේශාධාර ව්‍යාපෘති හා වැඩසටහන්

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූලාණය යටතේ ව්‍යාපෘති 02 ක් හා වැඩසටහන් 01 ක් ක්‍රියාත්මක කර තිබුණි. ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, ඒවායේ ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.මිලියන 6,391.49 ක් වී තිබුණි. එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 5,795.76 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

### (අ) අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන

යථෝක්ත වැඩසටහන යටතේ කර තිබුණු ගනුදෙනු සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මහින්දෝදය තාක්ෂණික විද්‍යාපීඨ ඉදිකිරීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 657 ක් සනීපාරක්ෂාව පෙරට ජාතික වැඩ සටහන යටතේ පාසල් සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා භාවිතා කර තිබුණි.

(ii) තාක්ෂණික විද්‍යාපීඨ ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා 2015 වර්ෂයේදී රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ සඳහා වූ භෞතික සැලසුම් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර, ප්‍රතිපාදනවලින් රු.මිලියන 19.63 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය කර තිබුණි. මෙම අළුත්වැඩියා කටයුතුවල භෞතික ප්‍රගතියට අදාළ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ව්‍යාපෘතියේ ප්‍රතිපාදන නිකුතු හා බැඳුනු දර්ශක 07 අනුව පාසල් විදුහල්පතිවරුන් 343 දෙනෙක් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් 593 දෙනෙක් 2015 දෙසැම්බර් 31 දින වන විට පුහුණු කර තිබුණි. ජාතික පාසල් 155 ක විදුහල්පති තනතුරු 2015 දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩුව පැවතුන අතර, ඉන් විදුහල්පති තනතුරු 49 ක් 2009 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි.

(iv) ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉදිකිරීමට අපේක්ෂිතව තිබුණ තාක්ෂණික විද්‍යාපීඨ ගොඩනැගිලි 250 කින් ගොඩනැගිලි 195 ක ඉදිකිරීම් 2015 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණු අතර, විද්‍යාපීඨ 86 ක සිසුන්ගේ භාවිතය සඳහා ඒවා විවෘත කර තිබුණි. කොළඹ සහ කළුතර දිස්ත්‍රික්වල මහින්දෝදය විද්‍යාපීඨ ගොඩනැගිලි 35 ක් ඉදිකිරීමට යෝජනා කර තිබුණු අතර, ඉන් 17 ක වැඩ අවසන් කර 12 ක් භාවිතය සඳහා විවෘත කර තිබුණි. ඉන් පාසල් 06 ක් සම්බන්ධයෙන් කරන ලද භෞතික පරීක්ෂණවලදී ඉදිකිරීම්වල ඇතැම් ස්ථානවල පිපිරීම් හා ඉරිතැලීම් තිබුණු බව නිරීක්ෂණය විය.

(v) මහින්දෝදය තාක්ෂණික විද්‍යාපීඨ සඳහා සියළු පහසුකම් සලසා තිබුණු නමුත්, බදුල්ල, යාපනය හා වව්නියාව දිස්ත්‍රික්කවල පාසල් 03 ක ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාව හැදෑරීම සඳහා වූ පන්තිවල එකදු ශිෂ්‍යයෙකු නොවූ අතර, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පාසලක ජෛව තාක්ෂණ විෂය ධාරා පන්ති සඳහා කිසිදු ශිෂ්‍යයෙකු හෝ ඉදිරිපත් වී නොතිබුණි.

(vi) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2015 දෙසැම්බර් 31 දින වන විට තාක්‍ෂණික විද්‍යා විෂය ධාරාව සඳහා දිවයින පුරා පාසල්වල වූ සමස්ථ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 660 ක් වී තිබුණි.

(vii) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී තාක්‍ෂණික විෂය ධාරාව හැදෑරීම සඳහා සිසුන් 42,514 ක්ද, විද්‍යා හා ගණිත ධාරාවන් හැදෑරීම සඳහා සිසුන් 118,901 ක්ද, ලියාපදිංචි වී තිබුණි. ඉකුත් වර්ෂයේදී තාක්‍ෂණික විෂය ධාරාව හැදෑරීම සඳහා සිසුන් 28,985 ක්ද, විද්‍යා හා ගණිත ධාරාව හැදෑරීම සඳහා සිසුන් 118,550 ක්ද විය. තවද, සමාලෝචිත වර්ෂයේදී වාණිජ විෂය ධාරාව යටතේ සිසුන් 117,238 ක් ලියාපදිංචි වී තිබුණු අතර, එය ඉකුත් වර්ෂයේදී 119,093 ක් වී තිබුණි.

(viii) 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය මගින් මහින්දෝදය තාක්‍ෂණික විද්‍යාපීඨවල භාවිතය සඳහා කාර්මික, සිවිල් හා විද්‍යුත් ඉංජිනේරු උපකරණ හා ආම්පන්න කාණ්ඩ 07 ක් යටතේ අයිතම 166 ක් රු. මිලියන 1,697.64 කට මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු වෙත ප්‍රසම්පාදනය ප්‍රදානය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- ලංසු ඇගයීමේදී කාණ්ඩ වශයෙන් ඇගයීම් නොකර අයිතම් වශයෙන් ඇගයීම් සිදුකලේ නම් අවම මිල ගණන්වලට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ හැකිව තිබුණි. කාණ්ඩ 07 කින් කාණ්ඩ 02 ක් පිළිබඳව සිදුකළ නියැදි විගණන පරීක්‍ෂාවේදී අයිතම් වශයෙන් ඇගයීම් කලේ නම් රු.මිලියන 55.73 කට මිලදී ගත හැකිව තිබුණු උපකරණ හා මෙවලම් රු.මිලියන 66.52 කට මිලදී ගෙන තිබුණි.

- තාක්‍ෂණික විද්‍යාපීඨවල භාවිතය සඳහා අවශ්‍ය වූ අයිතම 166 ක් මිලදී ගැනීමට අපේක්‍ෂිතව තිබුණද, රු.මිලියන 373.44 ක් වටිනා අයිතම් 71 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. අවශ්‍ය ප්‍රමාණය මිලදී ගැනීම සඳහා පමණක් මිල ගණන් කැඳවීමට කටයුතු කලේ නම් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තරඟකාරීත්වය තුළින් ලබාගත හැකිව තිබූ ආර්ථිකමය වාසිය ලබාගත හැකිව තිබුණි.

(ix) විද්‍යාපීඨ 250ක් සඳහා උපකරණ හා මෙවලම් මිලදී ගෙන අදාළ විද්‍යාපීඨ සඳහා ලබාදී තිබුණි. නමුත්, ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තා අනුව තාක්‍ෂණික විද්‍යාපීඨ 86 ක් පමණක් භාවිතා කර තිබුණි.

(ආ) **දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය**

විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරු අනුව, යථෝක්ත ව්‍යාපෘති අරමුදලින් දිවයිනේ පාසල් 1,644 ක් සඳහා පාසල් පරිගණක ජාල පහසුකම් සලසා තිබුණි. පරිගණක ජාලය මන්දගාමී වීම, බොහෝ අවස්ථාවලදී සම්බන්ධතා විදාන සංඥා (signal) නොමැතිවීම ආදී වූ විවිධ හේතු රාශියක් නිසා එය භාවිතයෙන් ඉවත් කර තිබුණි. විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරු අනුව ජාතික පාසල් 76 ක්ද ඒ අතර විය.

(ඇ) **දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩ සටහන**

යථෝක්ත වැඩ සටහන සඳහා වූ අරමුදලින් සිදුකර තිබුණු ගනුදෙනු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ මුල් අර්ධ වර්ෂයේ සෑම මාසයක් අවසානයේදීම රුපියල් මිලියන 23 ක සිට රු.මිලියන 96 ක් දක්වා පරාසයක ශේෂයන්ද, ජූලි මාසයේ සිට

සැප්තැම්බර් මාසය දක්වා මාසවල රුපියල් මිලියන 37 ක සිට රු.මිලියන 53 ක් දක්වා පරාසයක ශේෂයන්ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ බැංකු ජංගම ගිණුම්වල ඉතිරිව තිබුණි.

(ii) අමාත්‍යාංශය විසින් මහින්දෝදය විද්‍යාගාර 1005 ක් ඉදිකිරීම් සඳහා 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.මිලියන 12.58 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. ඉන් රු.මිලියන 12.24 ක් 2015 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර තිබුණි. විද්‍යාගාර 989 ක ඉදිකිරීම් 2015 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබුණු අතර, ඉන් 823 ක අධ්‍යාපන කටයුතු 2016 මාර්තු 31 දින වන විට ආරම්භ කර තිබුණි. ගුරු ඌණතාවය හා අනෙකුත් පහසුකම්වල අඩුපාඩුකම් හේතුවෙන් ඉතිරි විද්‍යාගාර 166 භාවිතයෙන් තොරව පැවතුණි. විද්‍යාගාර 07 ක ඉදිකිරීම් අවසන් කර නොතිබුණ අතර, විද්‍යාගාර 09 ක ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

(iii) වෙනත් පාසල් ගොඩනැගිලි 55 ක ඉදිකිරීම් සඳහා රු. මිලියන 149.63 ක් වැය කර තිබුණි. 2015 නොවැම්බර් 30 දින වන විට එම පාසලේ ගොඩනැගිලි ඉදිකිරීම අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, 2016 මාර්තු 31 දින වන විටත්, එම ඉදිකිරීම අවසන් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්ම අනුව ගුරු නේවාසිකාගාර 15 ක කටයුතු 2016 මාර්තු 31 දිනට පෙර අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණද, 2016 අප්‍රේල් 30 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. මීට අමතරව ජාතික පාසල් 18 ක සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම 2015 නොවැම්බර් 30 දින වන විට අවසන් කිරීමට අපේක්ෂිතව පැවති අතර, ඒ සඳහා රු. මිලියන 26.73 ක් වැය කර තිබුණි. 2016 අප්‍රේල් 30 දින වන විටත්, එම කටයුතු අවසන් කර නොතිබුණි.

(iv) කොළඹ සහ කළුතර දිස්ත්‍රික්වල විද්‍යාගාර 77 කින් 06 ක සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී බිත්ති හා පොළොවෙහි පිපිරීම් හා ඉරිතැලීම් වැනි ගුණාත්මක බවේ අඩුපාඩුකම් නිරීක්ෂණය වු අතර, 2014 වර්ෂයේ ඉදිකිරීම් අවසන් කර, පරිගණක වැනි උපකරණද සපයා තිබුණු වැතර මහා විද්‍යාලයේ විද්‍යාගාරය 2016 මාර්තු මාසය වන විටද වසා තිබුණි.

(v) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2015 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසල් 143 ක්ද ඇතුළුව පාසල් 353 ක අ.පො.ස. (උසස් පෙළ) සඳහා තාක්ෂණික විෂය ධාරාව ආරම්භ කර තිබුණි. සිසුන් 40,589 ක් එම විෂය ධාරාවේ විෂයයන් තෝරාගෙන තිබුණු අතර, තාක්ෂණික විෂය ධාරා පන්ති සඳහා එම එක් එක් විෂයයන් ඉගැන්වීම වෙනුවෙන් ගුරුවරුන් 334 දෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි.

(vi) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, දිවයිනේ 2015 වර්ෂයේ අ.පො.ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල අනුව විද්‍යා විෂය සඳහා A සහ B සමාර්ථයන් ලත් ප්‍රමාණය සියයට 16.61 ක් වු අතර, එය 2014 වර්ෂයේදී සියයට 13.07 ක් වී තිබුණි.

(vii) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2015 වර්ෂයේ පැවැත්වු අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි පාසල් අපේක්ෂකයින් 210,340 කින් 18,183 ක් හෙවත් සියයට 8.64 ක් සියළු ධාරාවන්ගේ සියළු විෂයයන්ගෙන් අසමත් වී තිබුණි. සිසුන් 5,930 ක් හෙවත් සියයට 2.83 ක් සියළු විෂයයන් සඳහා A සමාර්ථ ලබාගෙන තිබුණි.

(viii) 2015 වර්ෂයේදී මුල්වරට ශ්‍රී ලංකාවේ පැවැත්වූ අ.පො.ස. (උසස් පෙළ) ඉංජිනේරු හා ජෛව විද්‍යා තාක්‍ෂණ විෂය ධාරාවෙන් පිළිවෙලින් සියයට 50.09 ක් හා සියයට 60.66 ක සමාර්ථ වාර්තා කර තිබුණි. අපේක්‍ෂකයින් 11 දෙනෙකු පමණක් සියළු විෂයයන් සඳහා A සමාර්ථ ලබාගෙන තිබුණු අතර, භෞතික විද්‍යා ධාරාවෙන් සියයට 51.65 ක්ද, ජීව විද්‍යා ධාරාවෙන් 48.03 ක්ද විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබුණි. ව්‍යාපෘති ඇගයීම් වාර්තාව අනුව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා ඉදිරිපත් වන අපේක්‍ෂකයන්ගෙන් වාණිජ හා කලා විෂය ධාරාවන්ට වඩා වැඩි ප්‍රතිශතයක් විද්‍යා හා තාක්‍ෂණික විෂය ධාරාවන්ගෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීම අපේක්ෂිතව තිබුණි. නමුත්, වාණිජ විෂය ධාරාව හැදෑරූ පාසල් අපේක්‍ෂකයින්ගෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සියයට 70.38 ක් වූ වැඩිම ප්‍රතිශතය වාර්තා කර තිබුණි.

(ix) අ.පො.ස. (උසස් පෙළ) සියළු ධාරාවන්ගෙන් සියළු විෂයයන් අසමත් ප්‍රමාණය පසුගිය වර්ෂ දෙක තුළ වැඩි වී තිබුණු අතර, 2014 වර්ෂයේදී සියයට 5.39 ක් හා සියයට 12.17 ක්ව තිබුණු කාන්තා හා පිරිමි අසමත්වීමේ ප්‍රතිශත 2015 වර්ෂයේදී පිළිවෙලින් සියයට 06.16 ක් හා සියයට 13.37 ක් දක්වා වැඩි වී තිබුණි.

(x) පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත්වීමේ ප්‍රතිශතය පසුගිය වර්ෂ තුන තුළදී අඛණ්ඩව පහත වැටී තිබුණු අතර, 2013 වර්ෂයේදී සියයට 10.12 ක්ව තිබුණු සමත්වීමේ ප්‍රතිශතය 2015 වර්ෂයේදී සියයට 09.55 දක්වා පහත වැටී තිබුණි.

## 3.11 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

පිහිනුම් තටාකයක් ඉදිකිරීමේ අරමුදලක් සඳහා කොළඹ ජාතික පිරිමි පාසලක් විසින් එකතු කරන ලද රු.6,000,000 ක් 2007 දෙසැම්බර් 19 දින ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට එම ආයෝජනයේ වටිනාකම රු. 20,203,796 ක් වී තිබුණි. කෙසේ වෙතත්, 2016 ජුලි 25 දින වන විටත් අදාළ පිහිණුම් තටාකය ඉදිකිරීමට අදාළ කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි.

## 3.12 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම මගින් ආබාධිත හා අස්ථාන ගතවූ ළමයින්ගේ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහාද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමද අරමුණු කරගෙන 1999 අංක 44 දරන යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් පනතේ 08 වන වගන්තියේ සඳහන් අරමුණු ඉටුකිරීම සඳහා අරමුදල ස්ථාපිත කර තිබුණි. 1999 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අරමුදල වෙත රු.10,263,494 ක් ලැබී තිබුණු අතර, එම අරමුදල් අදාළ අරමුණු ඉටුකරගැනීම සඳහා 2014 දෙසැම්බර් 31

දින යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව වෙත ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

- 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව දත්ත ගබඩාව සැකසීම, තෝරා ගැනීමේ නිර්නායකයන් සැලැසුම් කර ඇගයීම, ශිෂ්‍යත්ව ලබාදීම 2016 මාර්තු මාසය වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි.

- අරමුදල වෙනුවෙන් මුදල් රැස්කිරීමට, ප්‍රචාරණ කටයුතු කිරීම සඳහා රු.120,000 ක් වැය කරමින් පෝස්ටර් හා කොඩි සකසා 2016 මාර්තු මාසය අවසානය වන විට මාස 06 කට වැඩි කාලයක් ඉකුත්ව තිබුණද, ඒවා ප්‍රචාරණ කටයුතු සඳහා උපයෝජනය කර නොතිබුණි.

- 1999 ජුනි 04 දින අරමුදල පිහිටුවා, විගණිත දින වන විට වසර 16 ක කාලයක් ඉක්මවා තිබුණද, එහි අරමුණු ඉටු කරගැනීම සඳහා යුනෙස්කෝ අරමුදල අපොහොසත් වී තිබුණි.

(ii) 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය අනුව අවුරුදු 05 ක සිට අවුරුදු 14 ක් දක්වා වයස් කාණ්ඩයේ පසුවන දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට පෞද්ගලික පාසල් ආරම්භ කළ නොහැකි වුවද, ඊට අනුකූල නොවන අයුරු ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් 214 ක් පමණ ආරම්භ කර තිබුණි. එම පාසල්වල මානව හා භෞතික සම්පත්වල ගුණාත්මකභාවය තක්සේරු කිරීම හා විෂයමාලා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ ක්‍රියාත්මක වන්නේද යන්න අධීක්‍ෂණය කිරීම සඳහා විධිමත් ප්‍රතිපත්තියක් හා ප්‍රමිතියක් නොතිබුණි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලදී පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් විධිමත් කිරීම සඳහා විධිවිධාන සැලසීමට නියමිත බව ලේකම්වරයා දන්වා එවා තිබුණි.

(iii) රජයේ ආධාර ලබන හා නොලබන පාසල් 80 කින් පාසල් 54 ක ලියාපදිංචි කිරීමේ සහතික විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අනුමැතියකින් තොරව පෞද්ගලික පාසල්වල උප ශාඛා ආරම්භ කර, ගුරුවරුන් බඳවාගෙන, ඔවුන්ටද අමාත්‍යාංශයෙන් වැටුප් ගෙවා තිබුණි.

(iv) 2015 වර්ෂයේදී ජාතික පාසල් 58 ක විවිධ ක්‍රීඩා වර්ග 646 ක් සඳහා සහභාගීවී තිබුණු සිසුන් සංඛ්‍යාව 33,988 ක් විය. බාහිර ක්‍රීඩා පුහුණුකරුවන් වෙත එකතුව රු.59,937,420 ක් ගෙවා තිබුණු අතර සිසු දරුවන්ගෙන් එකතුව රු.7,398,450 ක් අයකර තිබුණි. කෙසේ වෙතත්, 2015 ජනවාරි 29 දිනැති අංක 5/2015 දරන අධ්‍යාපන අමාත්‍යාංශය චක්‍රලේඛය මගින් විවිධ කාර්යයන් සඳහා පාසල් සිසුන්ගෙන් මුදල් අයකිරීම අත්හිටුවනු ලබන බවත්, පාසලේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මූල්‍ය ප්‍රතිප්‍රදාන ලබාදීමට කටයුතු කර ඇති බවත්, ලේකම්වරයා විසින් විගණනය වෙත දන්වා එවා තිබුණි.

(v) 2015 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසල් 38 ක ගිවිසුම් ප්‍රකාරව හිඟ හිටි ආදායම රු.4,190,376 ක් වී තිබුණත්, එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමට ප්‍රධානීන් පියවර ගෙන නොතිබුණි.

(vi) 2015 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසලක අයකර නොතිබුණු ශ්‍රවණාගාර හිඟ කුලී අදායම රු.190, 000 ක් වී තිබුණි.

(vii) තම පාසල්වල හෝ අවට සහෝදර පාසල්වල හෝ ප්‍රමාණවත් ශ්‍රවණාගාර හෝ ශාලා පහසුකම් තිබියදී ජාතික පාසල් 12 ක විවිධ උත්සව සඳහා පෞද්ගලික ආයතන සතු ශ්‍රවනාගාර හෝ ශාලා පහසුකම් ලබා ගෙන තිබුණි. 2015 වර්ෂයේදී ඒ සඳහා වැයකර තිබුණු මුළු මුදල රු. 5,184,584 ක් වී තිබුණි. කොළඹ ආනන්ද විද්‍යාලයේ නේවාසික ගුරු පුහුණු වැඩ සටහන් දෙකක් කුකුලේගමදී පැවත්වීම වෙනුවෙන් රු.1,141,092 ක් වැය කර තිබුණි.

(viii) ජාතික පාසල් 22 ක ගුරුභවතුන් 497 දෙනෙකු වෙත බැහැර දුන් පොත් ආපසු ලබාදීම ප්‍රමාද වූ අවස්ථා 1033 ක් අනාවරණය වී තිබුණත්, අදාළ ප්‍රමාද ගාස්තු 2016 මැයි 31 දින වන විටත් අයකර නොතිබුණි.

(ix) ජාතික පාසල් 21 ක ගුරුභවතුන් 170 දෙනෙකු ස්ථාන මාරුවීම්, විදේශගත වීම්, විශ්‍රාම යාම් හා සේවයෙන් ඉවත්වීම් වැනි අවස්ථාවලදී ආපසු භාරදී නොතිබුණු පොත් සංඛ්‍යාව 395 ක් වී තිබුණි. එහි වටිනාකම රු.44,387 ක් වූ අතර, එම පොත් හෝ ඒවායේ වටිනාකම හෝ ආපසු ලබා නොගෙන එම ගුරුභවතුන් සේවයෙන් නිදහස් කර තිබුණි.

(x) 2015 වර්ෂයේදී ජාතික පාසල් 75 ක අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 1847 දෙනෙකු හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 354 දෙනෙකු පුරුද්දක් ලෙස ප්‍රමාදවී සේවයට වාර්තා කර තිබුණි.

(xi) අමාත්‍යාංශ චක්‍රලේඛ හා ලිපි දෙමළ මාධ්‍ය පාසල් වෙත දෙමළෙන් නොලැබුණු අවස්ථා පවතින බවද, අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩ මුළු හා දේශන සඳහා කැඳවන දෙමළ මාධ්‍ය පාසල්වල ගුරුභවතුන් සඳහා වැඩමුළු හා දේශන දෙමළ භාෂාවෙන් නොපවත්වන බවද වාර්තා කර තිබුණි.

(xii) ජාතික පාසල් 13 ක් විසින් විවිධ අවස්ථාවන්හිදී නිකුත් කර තිබුණු එකතුව රු.3,929,678 ක තත්කාර්ය අතුරු අග්‍රිම 2015 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

(xiii) හොරණ ජාතික පාසලක 2014 වර්ෂයේ උසස් පෙළ විභාගයට ඉදිරිපත් වූ සිසුන්ගෙන් භෞතික විද්‍යාව විෂය සිසුන් 60 කින් 32 ක් ද, රසායනික විද්‍යා විෂය සිසුන් 65 කින් 46 ක්ද, සංයුක්ත ගණිතය සිසුන් 39 කින් සිසුන් 31 ක් ද, සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයෙන් සිසුන් 254 කින් සිසුන් 140 ක්ද, වශයෙන් අසමත් වී තිබුණි. 2015 වර්ෂයේ 6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය සඳහා ගුරු භවතුන් වෙත ලබා දී තිබුණු කාල සටහන්වලට අනුකූලව ඉගැන්වීම් සිදුකළ කාල පරිච්ඡේද ප්‍රමාණය සියයට 72 ක් වී තිබුණි.

(xiv) 2015 වාර්ෂික විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු කැඳවමින්, 2016 පෙබරවාරි 15 දින යවන ලද ලිපියට ජාතික පාසල් 54 කින් 2016 ජුනි 30 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි. 2014 වාර්ෂික විගණනය සඳහා තොරතුරු කැඳවමින් 2015 පෙබරවාරි 13 දින යවන ලද ලිපියට ජාතික පාසල් 63 කින් පිළිතුරු එවා නොතිබුණි. ඒ අතර වූ පාසල් 06 ක් වසර දෙක සඳහාම පිළිතුරු එවා නොතිබුණි.

**3.13 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේදී ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීම සඳහා ජාතික පාසල් 40 ක් වෙත රු.2,748,592 ක් ලබාදී තිබුණි. ඉන් රු.1,475,910 ක් අදාළ ගුණාත්මක යෙදවුම් සඳහා යොදාගෙන නොතිබුණු බැවින් 2015 දෙසැම්බර් 31 දින වන විටත් පාසල් සංවර්ධන සමිති ජංගම ගිණුම්වල එම මුදල් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ජාතික පාසල් 43 ක පාසල් සංවර්ධන සමිතිවලට අයත් එකතුව රු.633,803,600 ක් වූ මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

**3.14 අවිධිමත් ගනුදෙනු**

2015 වර්ෂයේදී විශේෂ අධ්‍යාපන සම්පත් තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 5 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. 2015 අප්‍රේල් 30 දින ආරම්භ කර 2015 නොවැම්බර් 30 දින අවසන් කිරීම සඳහා වූ ව්‍යාපෘතියෙන්ම, මුල්ගල තැබීම සඳහා රු.243,000 ක් 2015 ජුලි 14 දින වැය කර තිබුණි. භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදනවලින් රු.1,381,783 ක් ගේට්ටුව සහ ආරක්ෂක වැට ඉදිකිරීම සඳහා වැය කර තවත් රු.3,146,926 ක් ගෙවීම සඳහා බැරකම්වලට එළඹ තිබුණි. අදාළ මධ්‍යස්ථානය ඉදිකිරීම ආරම්භ කිරීමට හා ඉඩමේ පූර්ණ අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට 2016 ජුලි 25 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

**3.15 අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

කොරියානු ආධාර යටතේ ලබාදී තිබුණු විද්‍යුත් පියානෝ 3000 කින් 100 ක්, ග්‍රීන්බෝඩ් හා සීනු අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථයට හසු නොවන පෙර පාසල් සඳහා ලබාදී තිබුණි. ආධාර වශයෙන් ගබඩාවට ලැබෙන භාණ්ඩ හා නියැදි ලෙස ගබඩාවට ලැබෙන භාණ්ඩ පිළිබඳව ලේඛන ගත කිරීම නිසි පරිදි, නිවැරදිව සිදු නොකිරීම හේතුවෙන් ගබඩා ද්‍රව්‍ය අස්ථානගත වීමට හෝ හිතාමතා වංචා කිරීමට ඉඩකඩ සැලසී තිබුණි.

**3.16 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2015 ජුනි 22 දින සිට 26 දින දක්වා බහමාස් රාජ්‍යයේ පැවැත්වීමට යෙදුණු පොදු රාජ්‍ය මණ්ඩලීය අධ්‍යාපන අමාත්‍යවරුන්ගේ සම්මේලනය නියෝජනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසාගැනීම සඳහා ගෙවීම් කර තිබුණි. එම සමුළුව සඳහා සහභාගී නොවීම හේතුවෙන් ටිකට්පත් අවලංගු කිරීමේ හා වීසා ගාස්තු වෙනුවෙන් ගෙවූ මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට නොහැකි වූ රු.129,400 ක් අමාත්‍යාංශයට පාඩු වී තිබුණි.

(ආ) පූර්ව සැලැස්මකින් තොරව වර්ෂය අවසාන භාගයේ ගන්නා ලද තීරණයකට අනුව ද්විතියික හා ජාතික පාසල් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම වෙනුවෙන් පාසල් 1,166 ක් වෙත එක් පාසලකට රුපියල් මිලියන 2 බැගින් ද, අනෙකුත් වියදම් සඳහා රු. මිලියන 59.65 ක්ද, වශයෙන් රු. මිලියන 2,391,65 ක් වූ මුළු ඇස්තමේන්තු පිරිවැයක් මත ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි. 2012 අගෝස්තු 09 දිනැති අංක අමප/12/0984/530/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මේ සඳහා පදනම් කරගෙන තිබුණු අතර, එහි මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ (ii) හි පෝෂිත ප්‍රාථමික පාසල්වල විදුලිය, ජලය, වැසිකිලි හා සනීපාරක්ෂක පහසුකම් පිළිබඳව දක්වා තිබුණත්, ද්විතියික හා ජාතික පාසල්වල සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම පිළිබඳව පැහැදිලිව සඳහන් කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සිදුවී තිබුණ වාහන අනතුරු 6 කින් අමාත්‍යාංශයට අයකර ගත නොහැකිව තිබුණු අලාභය රු.1,580,886 ක් වී තිබුණි.

(ඈ) රථ වාහන අනතුරකදී එහි අලාභය හෝ පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ සිදුකළ යුතු වුවත්, 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ අමාත්‍යාංශය සතු වාහන සම්බන්ධ අනතුරු 28 කින් 4 ක් සඳහා මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාර ප්‍රාරම්භක වාර්තාද, අනතුරු 23 ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තාද, ඉදිරිපත් කර නොතිබුණි. ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට මාස 01 ක සිට මාස 18 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයන් සිදුකර තිබුණි.

(ඉ) කොළඹ 07 බාලිකා විද්‍යාලයක වැඩ අවසන් කර නොතිබුණු ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීමේ කාර්යයන් වසරකින් ප්‍රමාද වීම හේතුවෙන් මිල විචලනය වෙනුවෙන් රු.1,033,278 ක වැඩිපුර ගෙවීමට සිදු කර තිබුණි.

**3.17 අනාර්ථික ගනුදෙනු**

**---------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) පාසල් අවශ්‍යතාවයන් හඳුනා නොගෙන හා පාසල්වල පවතින ඇඳන්වල දිග පළල නොවිමසා ක්‍රීඩා පාසල් සඳහා රු. 3,543,750 කට 72"×42"×4" ප්‍රමාණයේ නිදන මෙට්ට 500 ක් හා 72"×30"×4" ප්‍රමාණයේ නිදන මෙට්ට 625 ක් මිලදී ගෙන තිබුණි. එම මෙට්ට ප්‍රමිතියට නොතිබුණු බැවින් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) ක්‍රීඩා පාසල් සඳහා ද්විත්ව යකඩ ඇඳන් 250 ක් රු.5,357,065 ක් වූ මිලකට මිලදීගෙන තිබුණි. ඒවායේ ගුණාත්මක බව හා පිරිවිතරයන්ට අනුකූලව සපයා තිබුණු බව සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) පැකට් එකකට රු. 8 ක් බැගින් ගබඩාවේ පැවති නිල ඇඳුම් පැකට් 1,179,350 ක පණිවිඩය වෙනස් කර පැකට් කිරීම සඳහා පෞද්ගලික ආයතන 4 කට රු. 9,434,800 ක් ගෙවීමට එකඟ වී තිබුණි.

(ඈ) කොළඹ අධ්‍යාපන කොට්ඨාශයේ පිහිටි ජාතික පාසලක් සඳහා විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 5 ක් 2016 ජනවාරි මාසයේදී අමාත්‍යාංශයේ තැන්පත් කර තිබුණි.

2016 ජුනි දක්වා එම ප්‍රසම්පාදනයට අවශ්‍ය කටයුතු සිදුකිරීමේ ප්‍රමාදය හේතුවෙන් 2014 වර්ෂයේ සිට 2016 පෙබරවාරි මාසය දක්වා විදුලි ජනන යන්ත්‍ර කුලී පදනම මත ගැනීම සඳහා එකතුව රු.1,710,500 ක් වරින්වර පාසල් සංවර්ධන සමිතියෙන් ගෙවා තිබුණි.

## 3.18 විසඳා නොතිබුණු විගණන ඡේද

අමාත්‍යාංශයට අදාළව ඉකුත් වර්ෂවල විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2014 | 3.15(අ) | කොළඹ ජාතික බාලිකා පාසලක ගෘහස්ත ක්‍රීඩාංගණයක් ඉදිකිරීම |
| | 3.15(ආ) | 2013 සැප්තැම්බර් 19 දිනැති අංක 13/1239/530/031-11 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු නොකිරීම හා සැපයුම්කරු සතු විය යුතු සුදුසුකම් පිළිබඳව නිසි පරිදි ඇගයීම් නොකරමින්, අන්තර් ජාතික තත්ත්වයේ නොවන මාදිලියක පරිගණක හා ලැප්ටොප් ඇතුළු අනෙකුත් උපකරණ මිලදී ගෙන තිබුණි. |
| | 3.16(ආ)ii | 2006 නොවැම්බර් 22 දිනැති අංක අමප/06/2125/206/072 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය 2007 ජනවාරි මාසයේ සිට ආරම්භ කර තිබුණු නමුත්, විදුහල පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික රාමුව ඇතුළත් පනතක් පිළියෙල කර අනුමත කර ගෙන නොතිබුණි. |
| | 3.18(ආ) | පස්යාලේ සිරි සඟබෝ විශේෂිත ළමා පාසල අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර නොතිබුණි. |
| | 3.22(ඌ) | නැණසල වැඩ සටහන සඳහා ලබාදී තිබුණු රූපවාහිනී යන්ත්‍ර 04 ක් අස්ථාන ගත වී තිබුණි. |

## 3.19 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 2,607 | 1,151 | 1,456 | - |
| (ii) | තෘතියික මට්ටම | 1,559 | 1,390 | 171 | 2 |
| (iii) | ද්විතියික මට්ටම | 38,551 | 40,266 | 2,574 | 4,289 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 8,572 | 6,237 | 2,551 | 216 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 242 | 136 | 106 | - |
| | **එකතුව** | **51,531** | **49,180** | **6,858** | **4,507** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 6,858 ක් පිරවීමටද, 4507 ක අතිරික්තයක් අවම කිරීමටද අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ii) ජාතික පාසල් 37 ක් වෙත දෙවන භාෂාවක් ලෙස දෙමළ හෝ සිංහල ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් ගුරුභවතුන් සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණු අතර, ඒ සඳහා බඳවා ගෙන තිබුණ බාහිර ගුරුභවතුන් 41 දෙනෙකු වෙනුවෙන් වැටුප් ලෙස රු.3,779,386 ක මුදලක් 2015 වර්ෂයේදී පාසල් සංවර්ධන සමිති විසින් ගෙවා තිබුණි.

(iii) 2015 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසල් 39 ක පාසල් සංවර්ධන සමිතිවලින් හෝ වෙනත් අරමුදල්වලින් හෝ වැටුප් ගෙවමින් බඳවා ගෙන තිබුණු අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව 196 ක් වී තිබුණි. 2015 වර්ෂයේදී පමණක් වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු.26,378,144 ක් ගෙවා තිබුණි.

(iv) 2015 දෙසැම්බර් 31 දිනට ජාතික පාසල් 29 ක අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 143 දෙනෙකුගේ අතිරික්තයක් සහ ජාතික පාසල් 73 ක අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 778 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.